දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NCCP/TE/PCU/ADM/04/2025
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 3/10/2025
Date )

# සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

පොදු චක්‍රලේඛ අංක: 01 - 40 /2025

**පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ**
**ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ**
**සියලුම සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්**

## ලෝක ගිලන ගිමන්හල් සහ සහන සත්කාර සේවා දින චක්‍රලේඛය - 2025
***"සෑමට සම සහන සත්කාර සේවාවක්: පොරොන්දුව සපුරමු "***

ලෝක ගිලන ගිමන්හල් සහ සහන සත්කාර සේවා දිනය සෑම වර්ෂයකම ඔක්තෝම්බර් මස දෙවන සෙනසුරාදා දින ලොව පුරා සමරනු ලැබේ. ඒ අනුව, මෙම වර්ෂයේදී ද ඔක්තෝම්බර් මස 11 වැනි සෙනසුරාදා දින, ***"සෑමට සම සහන සත්කාර සේවාවක් : පොරොන්දුව සපුරමු "*** යන තේමාව යටතේ එය සමරනු ලැබේ. ලෝක ගිලන ගිමන්හල් සහ සහන සත්කාර දිනය, සහන සත්කාර සේවාව වෙනුවෙන් ලොව පුරා ප්‍රජාව සහ රජයන් ඒකරාශී කරවා ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට සහ ඒ පිළිබඳව ජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීමට ඇති වැදගත් අවස්ථාවකි.

ජීවිතයට තර්ජනයක් විය හැකි රෝගාබාධයන්ගෙන් පෙළෙන රෝගීන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් පරිපූර්ණ ප්‍රවේශයක් ලෙස සහන සත්කාරය හඳුනාගෙන ඇත. වියෝ දුකින් පෙළෙන පවුල්වල අධ්‍යාත්මික, මානසික සහ සමාජයීය යහපැවැත්ම ද සහන සත්කාර සේවයේ කොටසක් ලෙස සැලකේ. සහන සත්කාර සේවාව ලබා ගැනීම ජීවිතයට තර්ජනයක් විය හැකි රෝගාබාධයන්ගෙන් පෙළෙන සෑම පුද්ගලයකුගේම අයිතියක් වන අතර, අවශ්‍යතාවය අනුව සහන සත්කාර සේවාව සැපයීම සෞඛ්‍ය සේවා වෘත්තිකයන් ඇතුළු සෑම කෙනෙකුගේම වගකීමකි. ලොව පුරා සෑම වසරකම මිලියන 60ක පමණ ජනතාවකට සහන සත්කාර සේවා අවශ්‍ය වන බවද ඒ අතරින් අදාල සේවාව ලැබෙන්නේ 14% ට පමණක් බවද ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඇස්තමේන්තු කර ඇත.

අඩු-මධ්‍ය ආදායම් ලබන රටක් වූ ශ්‍රී ලංකාවේද, පිළිකා ඇතුළු බෝ නොවන රෝග සහ අනෙකුත් නිදන්ගත රෝගවල අධික ව්‍යාප්තිය සහ වයස්ගත ජනගහනය වැඩිවීම හේතුවෙන් සහන සත්කාර සේවාවන්හි අවශ්‍යතාවය ඉහළ යමින් පවතී. එබැවින්, “සහන සත්කාරය අවශ්‍ය වන සියලුම රෝගීන්ට සිය ජීවිතය පවත්වාගෙන යාමට සහ ගෞරවාන්විත මරණයක් සඳහා අවශ්‍ය සේවාවන් ප්‍රධාන සෞඛ්‍ය ධාරාව තුළින්ම ලබා දිය යුතුය” යන්න ‘ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය 2016-2025’ මඟින් අවධාරණය කොට ඇත. තවද, ‘2019-2023 ශ්‍රී ලංකාවේ සහන සත්කාර සේවය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික උපායමාර්ගික ක්‍රියාරාමුව (සෞඛ්‍ය අමාත්‍යාංශය, 2019)’ මඟින් රටේ සහන සත්කාර සේවාවන් ප්‍රවර්ධනය සඳහා උපායමාර්ගික උපදෙස් සපයා ඇත. කෙසේ වෙතත්, වර්තමානයේ සැලකිය යුතු රෝගීන් සංඛ්‍යාවකට පරිපූර්ණ ප්‍රවේශයක් සහිත සහන සත්කාර සේවාවක් ලබාගැනීමට අවස්ථාවක් නොලැබේ.

මෙම වසරේ ‘ලෝක ගිලන ගිමන්හල් සහ සහන සත්කාර සේවා දිනය’ සැමරීමේදී පහත අංශ පිළිබඳව අවධාරණය කෙරේ.

- ගෝලීය ප්‍රජාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම
- ප්‍රතිපත්තිමය වෙනස්කම් සඳහා අවශ්‍ය උපදේශන සඳහා දායකත්වය.
- අවදානම් කණ්ඩායම් වෙනුවෙන් අවශ්‍ය සහන සත්කාර ලබාගැනීම සඳහා වූ ප්‍රවේශය වැඩි කිරීම

- සහන සත්කාර සේවා සඳහා කැප වී දායක වන සෞඛ්‍ය වෘත්තිකයන් සහ ස්වේච්ඡා සේවකයින් හට එම සේවාවන් සැලසීමට අවශ්‍ය පහසුකම් ලබා දීම.

ඒ අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික පිළිකා මර්දන වැඩසටහන, බෝ නොවන රෝග අංශය සමඟ එක්ව '2025 ලෝක ගිලන ගිමන්හල් සහ සහන සත්කාර දිනය' උපයෝගී කරගනිමින්, සහන සත්කාර සේවාවන්හි ඉහත සඳහන් අංශ කෙරෙහි සියලුම සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන පාර්ශවකරුවන්ගේ අවධානය යොමු කිරීමට අදහස් කරයි.

මෙම චක්‍රලේඛයේ අන්තර්ගතය තම ආයතනයේ අදාළ සියලුම සෞඛ්‍ය සේවා කාර්යමණ්ඩලයට (සෞඛ්‍ය අධ්‍යාපන ඒකකය, සහන සත්කාර ඒකකය, මහජන සෞඛ්‍ය නිලධාරීන් ආදිය ඇතුළුව) දැනුම් දෙන ලෙසත්, තම ආයතනයේ සහන සත්කාර සේවා ශක්තිමත් කිරීමට පහසුකම් සපයන ලෙසත් සියලුම ආයතන ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ඒ අනුව ඔක්තෝබර් මාසය තුළ ආයතනයේ පහත ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.

- සෞඛ්‍ය සේවා කාර්යමණ්ඩලය සඳහා ආයතනික මට්ටමින් සහන සත්කාර පිළිබඳ පුහුණු වැඩසටහන් සහ අදාළ සෞඛ්‍ය නොවන පාර්ශ්වකරුවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් පොදු ජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
  ඉහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා ජාතික පිළිකා මර්දන වැඩසටහනෙහි වෙබ් අඩවියේ (NCCP website) ඇතුළත් පත්‍රිකා, දත්ත සටහන් සහ දෘශ්‍ය මාධ්‍ය මෙවලම් ආදී තොරතුරු, අධ්‍යාපන සහ සන්නිවේදන ද්‍රව්‍ය (IEC Materials) භාවිත කළ හැක. NCCP වෙබ් අඩවි ලිපිනය - www.nccp.health.gov.lk
- ආයතනික මට්ටමින් සහන සත්කාර උපදේශක සේවා (Palliative Care Consult Services) ස්ථාපිත කිරීම / ශක්තිමත් කිරීම.
  සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද **2020/08/31** දිනැති අංක: **01-34/2020** දරන **චක්‍රලේඛය** මගින් සියලුම තෘතීයික සහ ද්විතීයික ආයතනවල ප්‍රධානීන්ට තම ආයතනයේ සහන සත්කාර උපදේශන සේවා ස්ථාපිත කිරීම / ශක්තිමත් කිරීම සඳහා මඟ පෙන්වීම සපයනු ඇත.
- ප්‍රාථමික ප්‍රතිකාර ඒකක වල සහන සත්කාර සේවාවන් සඳහා ඒ වෙනුවෙන් සැකසූ *'Palliative Care for Cancer Patients in Primary Health Care: A Guide for Health Care Professionals' (National Cancer Control Programme 2022)* මාර්ගෝපදේශකය උපයෝගී කරගැනීම
- තම ප්‍රජාව තුළ ගිලනගිමන්හල් සහ සහන සත්කාර සේවාවන්ට අදාල සිදුවීම්, සම්මන්ත්‍රණ හෝ වැඩමුළු සංවිධානය කිරීම හෝ සහභාගී වීම
- සමාජ මාධ්‍ය වේදිකා භාවිතා කරමින් 2025 ලෝක ගිලන ගිමන්හල් සහ සහන සත්කාර දිනය පිළිබඳව සහ මෙම සේවාවන්හි වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම

2025 ලෝක ගිලන ගිමන්හල් සහ සහන සත්කාර දිනය සමරනු වස් අදාල ආයතනය / දිස්ත්‍රික්කය විසින් පවත්වනු ලබන විශේෂ ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශ වාර්තාවක් ඡායාරූප සහිතව, 2025 නොවැම්බර් 15 වන දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ/ ජාතික පිළිකා මර්දන වැඩසටහන වෙත (ඊමේල් - nccpmohsl@gmail.com) එවීමට කටයුතු කිරීම ඉතා අගය කොට සලකන අතර, එම වාර්තා මෙරට සහන සත්කාර සේවා සංවර්ධනය කිරීමේදී අත්දැකීම් බෙදා ගැනීම සඳහා භාවිත කරනු ඇත.

මෙම ජාතික කර්තව්‍යයේදී ඔබගේ නායකත්වය, මඟපෙන්වීම සහ ක්‍රියාකාරී සහභාගීත්වය ඉතා අගය කොට සලකමි.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්:
සෞඛ්‍ය ලේකම්
අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා)
අතිරේක ලේකම් (වෛද්‍ය සේවා)
සියලුම ලේකම්වරුන් - පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය
සියලුම සහකාර අධ්‍යක්ෂ ජනරාල්වරුන් - සෞඛ්‍ය අමාත්‍යාංශය
අධ්‍යක්ෂ
ජාතික පිළිකා මර්දන වැඩසටහන / බෝ නොවන රෝග / සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය / පවුල් සෞඛ්‍ය කාර්යාංශය / ප්‍රාථමික සෞඛ්‍ය සේවා / ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය / තරුණ වැඩිහිටි සහ ආබාධිත පුද්ගලයින් / මානසික සෞඛ්‍ය / පෞද්ගලික සෞඛ්‍ය අංශ සංවර්ධනය
සියලුම සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්: ක්‍රියාකාරකම් සහ ප්‍රතිචාර (feedback) සඳහා
ප්‍රධාන වෛද්‍ය නිලධාරී - කොළඹ මහ නගර සභාව